# 21

# සීරතුර් රසූල් 01

## මුහම්මද් (සල්) තුමාගේ උපත හා තරුණවිය

නබිතුමාණන් ඉපදීමට දින කීපයකට පෙර යෙමන් දේශයේ රජතුමා වන 'අබ්රහා' විශාල සේනාවක් සමඟ කඃබාවට පහර දීම සඳහා පැමිණියේ ය. නමුත් අල්ලාහුතආලා අබාබීල් නැමැති කුඩා පක්ෂීන් මගින් එම සේනාව විනාශ කළේ ය. මෙම විශ්මිත සිදුවීම සිදු වූ වර්ෂය ඇත් වසර නම් වේ. මෙම වසරේ රබිඋල් අව්වල් මස සඳු දින හිමිදිරි උදෑසන නබිතුමාණෝ ඉපදුණහ. මෙය ක්‍රි.ව. 571 වන වසර ලෙස ගණනය කොට ඇත. නබිතුමා ගේ පියා ගේ නම අබ්දුල්ලා ය. මවගේ නම ආමිනා ය.

නබිතුමා ඉපදීමට පෙර පියාණෝ මරණයට පත් වූහ. පසුව අරාබිවරුන්ගේ චාරිත්‍රයට අනුකූල ව කිරි දී හදා වඩා ගැනීම සඳහා හලිමතුස් සඃදියා නැමැති ගැමි කාන්තාවට භාර දෙන ලදි. වසර 4ක් පමණ හලිමාගේ රැකවරණය යටතේ හැදී වැඩුණු පසු ව මව වු ආමිනාට භාරදෙනු ලැබූහ.

නබිතුමා තම මව සමඟ වයස 6 දී ඥාතීන් හමුවීම සඳහා යත්රිබයට ගියේ ය. එහි සිට මක්කාවට එන අතරතුර අෆ්රා නැමැති ස්ථානයේ දී තම මව වෆාත් වූවා ය. අනතුරුව සීයා වන අබ්දුල් මුත්තලිබ් විසින් කුඩා මුහම්මද්ට රැකවරණය දෙන ලදි. වයස අටේ දී සීයා අබ්දුල් මුත්තලිබ් ද මරණයට පත් විය. ඉන්පසුව මහප්පා වූ අබුතාලිබ්ගේ රැකවරණයට පත් විය.

අබුතාලිබ් දුප්පතෙකු වුවත් කුඩා මුහම්මද්ට තම දරුවන්ට වඩා සෙනෙහසත් රැකවරණයත් ලබා දුන්නේ ය. ඥාති සොහොයුරන් සමඟ එක්ව නබිතුමා අබුතාලිබ් ගේ එළුවන් රැක බලාගත්තේ ය.

තම 12වන වියේ දී මහප්පා වූ අබූතාලිබ් සමඟ සිරියාවට වෙළඳාමේ ගියේ ය. දකුණු සිරියාව ආසන්නයේ ''බුස්රා'' නැමැති ස්ථානයේ ක්‍රිස්තියානි පූජකවරයෙකු වූ ''බුහෙයිරා'' නැමැත්තාට නුබුව්වතයේ ලක්‍ෂණයන් කුඩා මුහම්මද් ගෙන් දිස් විය. එබැවින් එම පූජක තුමා කුඩා මුහම්මද් ව පිළිගෙන ගරු බුහුමන් දක්වා සංග්‍රහ කළේ ය. යුදෙව්වන් ගෙන් මෙම දරුවාට අනතුරු සිදුවිය හැකි බවට අවවාද කොට ඔහුව නැවතත් මක්කාවට රැගෙන යන ලෙස අබූතාලිබ්ට දැන්වූයේ ය.

නබිතුමාණන් ඉපදී හැදී වැඩුණ අරාබි රටේ එදා ජීවත් වූ මිනිස්සු අවිඥානයේ ගිලී සිටියහ. මත්පැන් පානය කිරීම, සූදුකෙළීම, මංකොල්ල කෑම, පලිගැනීම වැනි අකුසලයන් හි නොඅඩු ව යෙදුණහ. ශාක, ඉර, හඳ, තාරකා, ගින්දර හා පිළිම යනාදිය වන්දනාමාන කළහ.

ක්‍රමවත් පවුල් දිවියක් හෝ සමාජ ක්‍රමයක් එහි දක්නට නොවී ය. කාන්තාවෝ පහත් කොට සලකනු ලැබූහ. ජනයා ගෝත්‍ර වශයෙන් බෙදී වෙන්ව සිටියහ. සුළු කරුණක් මුල්කොට ගෙන වුව ද එම ගෝත්‍ර අතර සටන් පැවතියේ ය. බහුතර ජනයා ලිවීමට හෝ කියවීමට නොදත් 'උම්මි' වරු වූහ. මෙම ලක්‍ෂණයන් ගෙන් සමන්විත වූ එදා අරාබියේ සමාජ තත්වය ''අයියාමුල් ජාහිලියියා'' අවිඥානයේ යුගය ලෙස සඳහන් කරයි.

අයහපත් පරිසරයක් පැවැති මක්කාවේ ජීවත් වූ කුඩා මුහම්මද් කුඩා කල සිට ම යහගුණ පිරි අයක් වූයේ ය. කිසිදු කෙනෙකුට හෝ කිසිම ජීවියෙකුට හෝ වද හිංසා නොකළේ ය. එදා අරාබිවරුන් විසින් කරන ලද පාපී ක්‍රියාවන්, විනෝද ක්‍රියා හා නාස්තිකාරි ක්‍රීඩාවන් යනාදි කිසිවක එතුමා නිරත නොවි ය. පිළිම වන්දනය පිළිකුල් කළ එතුමා අන් අයට ආදර්ශවත්, යහගුණයන් ගෙන් යුක්ත ව ජීවත් විය.

බොරු කීමෙන් වැලකී සිටියේ ය. සැමවිටම සත්‍යය කථා කළේ ය. මෙනිසා ''අස්සාදික්'' සත්‍යවන්තයා යනුවෙන් අමතන ලදහ. කිසිවෙකුටත් ද්‍රෝහිකම් නොකළ එතුමා අවංක ව හා විශ්වාසවන්ත ව කටයුතු කළේ ය. මේ නිසා 'අල්අමීන්' විශ්වාසවන්තයා යනුවෙන් ද අමතනු ලැබූහ.

### තරුණවිය

තරුණ වියේ දී මුහම්මද් (සල්) තුමා මඩෙහි පිපුණු නෙළුමක් සේ වූහ. එතුමා තම වටා පිටාව තුළ කිසිවිටෙකත් අලසව කල් නොගෙවූහ. දහවල් කාලය වෙහෙස වී

ඉපැයීම් සඳහා ගත කළ එතුමාණෝ රාත්‍රි කාලයේ තම සමාජය පිළිබඳ ව මෙනෙහි කරමින් කාලය ගත කළහ. එතුමා එදා සමාජයේ මුල් බැසගෙන තිබූ වැරදි ක්‍රියාවන්ට යොමු ව නොමග ගියේ නැත. කරුණා දයාවෙන් හා ගෞරව බහුමානයෙන් සියලු දෙනා විසින් ම සලකනු ලැබීය.

## හර්බුල් ෆුජ්ජාර් සහ හිල්ෆුල් ෆුලූල් බිහිවීම

අරාබියේ ජනයා ගෝත්‍ර වශයෙන් බෙදී ජීවත් වූහ. මෙම ගෝත්‍රිකයන් අතර තරඟකාරීත්වය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වංචාව යනාදිය පැවතිණි. සුළු කරුණක් මුල්කොටගෙන වසර ගණන් සටන් කළෝ ය. සතුරන් ගෙන් පළිගැනීමේ දී අනුකම්පාවෙන් තොරව කටයුතු කළෝ ය. මෙලෙස වසර ගණනාවක් ම මක්කා වේ හර්බුල් ෆුජ්ජාර් නම් සටන පැවතිණි. මෙම සටන් නිසා මක්කා වැසියන් ගේ ජන ජීවිතයට හා සම්පත්වලට බලවත් හානි සිදු විය.

මේ පිළිබඳ ව අවබෝධ කරගත් යහපත් ආකල්ප වලින් යුත් නායකයෝ මක්කාව යළි ගොඩනැගීම සඳහා සැළසුම් සකස් කළහ. අර්ථ විරහිත සටන් යළි ඇති නොවීම සහතික කරනු වස් සමාජ ශුභසාධන සැලසුමක් ගොඩ නැගූහ. එය ''හිල්ෆුල් ෆුලූල්'' යනුවෙන් ඉතිහාසගත විය. අසාධාරණ සටන්වලට සහභාගි වීමෙන් වැළකී සිටි නබි (සල්) තුමාණෝ සටනින් අනතුරුව ගොඩනැගුනු සමාජ ශුභසාධන කටයුතු සැලසුම්වලට උනන්දුවෙන් සහභාගි වූහ.



கஃபதுல்லாஹ்வின் பழைய தோற்றம்

## විවාහය

නබිතුමා තම තරුණ වියේ දී වෙළෙඳ කටයුතු වල නිරත විය. විශ්වාසවන්ත සත්‍යවාදි අවංක භාවයෙන් අනුන වෙළෙන්දෙකු වූ එතුමා  කදීජා නැමැති කාන්තාව ගේ ව්‍යාපාරයේ කොටස්කරුවෙක් වූයේ ය. අවංක ව කටයුතු කළ එතුමා ආකර්ශණීය ලාභ ලැබී ය. නබිතුමාගේ යහ ගුණාංගයන් ගෙන් ආකර්ෂණය වු කදීජා එතුමා ව විවාහ කර ගැනීමට කැමැති වූවා ය. පවුලේ කැමැත්ත ඇතිව විවාහය සිදු කරන ලදී. එවිට නබිතුමාගේ වයස 25ක් වූ අතර, කදීජා තුමියගේ වයස අවුරුදු 40ක් විය.

## කඃබා ප්‍රතිසංස්කරණය

නබිතුමාට වයස 35 දී කඃබා ප්‍රතිසංස්කරණය සිදු විය. එවිට ස්වර්ගයෙන් පහළ කළ හජරුල් අස්වද් ගල තැන්පත් කිරීම සම්බන්‍ධයෙන් ගෝත්‍ර නායකයන් අතර මතභේද ඇති විය. නැවැතී තිබු ගෝත්‍රික සටන් නැවත ඇති වේදෝ යි බියක් පැතිරිණි.

එය වලකාගත යුතුය යන පොදු සම්මතයකට කුරෛයිෂිවරු එළැඹීයහ. එනම් කවරෙකු මුලින් කඃබාවට පැමිණෙන්නේද ඔහුගේ අදහස අනුව කටයුතු කරමු යන පොදු එකඟතාවට පැමිණියේ ය. පසුදින සියලු දෙනා බලා සිටි එම පුද්ගලයා කඃබාවට ආවේ ය. ඒ මුහම්මද් නම් තරුණයා ය.

මක්කාවේ ම යහපත් පුද්ගලයා පැමිණි බව පවසා ගෝත්‍ර නායකයෝ සතුටින් ඉපිලුණහ. යුක්ති සහගත අපක්‍ෂපාතී තීන්දුවක් ලැබේ යයි විශ්වාස කළහ. ඔවුන් අපේක්‍ෂා කළ අයුරින් මුහම්මද් (සල්) තුමාණෝ තීන්දුවක් ඉදිරිපත් කළහ. එම ගල එක් සළුවක් මත තබා ගෝත්‍රික නායකයින්ට එම සළුවේ කොන්වලින් අල්ලා එසවීමට සැලැස්විය. එලෙස ඔවුන් විසින් ඔසවන ලදි. ගල තැන්පත් කළ යුතු ස්ථානයට පැමිණි විට මුහම්මද් (සල්) තුමාණන් විසින් සළුව මත තිබු ගල අදාළ ස්ථානයේ තැන්පත් කළහ. මෙම බුද්ධිමත් තීරණය නිසා මක්කා ව නොසන්සුන්තාවයෙන් බේරුණි.

අභ්‍යාස

පහත වරහන් තුළ ඇති පිළිතුරු වලින් සුදුසු පිළිතුර තෝරා හිස්තැන් පුර වන්න.

(හලීමා, ඇත් වසර, නිරර්ථ ක්‍රීඩාවන්, සිරියාව, අබ්දුල් මුත්තලිබ්, ජාහිලියියා යුගය, හයවන, සටන්)

1. නබි තුමා ඉපදී හැදී වැඩුණු එදා අරාබියාවේ සමාජ තත්ත්වය ............. ............................ යනුවෙන් සඳහන් කරයි.
2. සුළු කරුණකට පවා ජාහිලියියා යුගයේ ගෝත්‍ර අතරේ .................... ඇති විය.
3. කඃබාවට පහර දීම සඳහා පැමිණි අබ්රහා ගේ ඇත් සේනාව විනාශ කළ වර්ෂය ............................ නම් වේ.
4. නබි (සල්) තුමාට කිරි පොවා රැකවරණය ලබා දුන් ග්‍රාමීය කාන්තාව .. ................................... නම් වේ.
5. නබි තුමා ගේ ...................... වියේ දී මව ආමිනා මරණයට පත් විය.
6. නබි තුමාගේ 8වන වියේදී සීයා වූ .......................... මරණයට පත් විය.
7. නබි තුමා තම 12 වන වියේ දී සුළු පියා වූ අබුතාලිබ් සමග ව්‍යාපාර කටයුතු සඳහා ........................... වට ගියේ ය.
8. නබි තුමා තම තරුණ වියේ දී පාපී ක්‍රියා, විනෝද ක්‍රියා හා .............. .................... යනාදියේ නිරත නොවී ය.